ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-11-11

පැමිණිලි පාර්ශවය : එම්.ජේ.එම්.රංජනි පෙරේරා මයා,
ප්‍රාදේශීය ලේකම් (විශ්‍රාමික),
අංක 40ඒ, කෝන්වැව,
තඹුත්තේගම.

වගඋත්තර පාර්ශවය :

01. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
තඹුත්තේගම.

02. දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුරය.

03. ලේකම්,
ස්වදේශ කටයුතු හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07

06. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගා වත්ත මහ ලේකම් කාර්යාලය,
කොළඹ 07.

**පැමිණිලි අංකය : HRC/AP/201/2016(S)**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමන් තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් ලෙස සේවය කරමින් සිටි කාලයේදී 2012.03.04 දින



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

රාජකාරියේ නිරතවෙමින් සිටියදි සිය නිල වාහනය වූ NCPC 5359 වාහනය අනතුරකට ලක්වූ බවත්, එම අවස්ථාවේදි රථය පදවාගෙන යනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රියදුරු වූ ඒ.පී අරුණ ගයාන් මහතා බවත්, එම අනතුර සිදුවූයේ WPGM2255 දරණ ලොරි රථය ක්ෂණිකව පාර හරහා දැමීම හේතුවෙන් බවත්ය. එම අවස්ථාවේදි පැමිණිලිකාරිය විසින් අනතුර වූ විගසම තඹුත්තේගම පොලිසියේ රථ වාහන අංශයටත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවටත් දැනුම්දුන් බවත්, සියලුම මුදල් රක්ෂණය මගින් ලබාදිය හැකි බව ප්‍රකාශ කළ බැවින් රජයට අලාභානියක් නොවන නිසා පැමිණිලිකාරිය යලි රාජකාරි කටයුතුවලට යෙදුනු බවත් දක්වා ඇත.

රථය අළුත්වැඩියා කිරීමට වැය වූ රු.110766 ක මුදල සම්පූර්ණයෙන්ම රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු බවත්, නමුත් එම මුදලෙන් රු. 55383.00 ක මුදලක් පැමිණිලිකාරියගේ විශ්‍රාම වැටුපෙන් සමාන වාරික 12 කින් අය කර ගත් බවත් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ වැටුපෙන් මසකට රු.4615.25 ක මුදලක් කපාගෙන ඇති බවත්, වාහනයට සිදුවූ හානියට අදාළ සම්පූර්ණ මුදලම රක්ෂණයෙන් අය වී ඇති බවත්, එබැවින් පැමිණිලිකාරියගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම සාධාරණ නොවන බවත් දක්වා ඇත. එමෙන්ම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව සංග්‍රහයේ 12(1) වගන්තිය අනුව විශ්‍රාම ගන්වා තිබියදි කිසිදු පරික්ෂණයකින් හෝ අධිහාර කිරීමකින් තොරව විශ්‍රාම වැටුපෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් පනතේ හෝ විශ්‍රාම ව්‍යවස්ථාව සංග්‍රහයේ කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බවත්, පැමිණිලිකාරිය විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකාරිය තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම්ව සිටියදි 2012.03.04 වන දින රාජකාරි කටයුත්තක් සඳහා පිටව යමින් සිටින අතරතුර NCPC 5359 දරණ රථයට අලාභ සිදුව ඇති බවත්, රජයේ දේපලකට හානි සිදුවුවහොත් අනතුරක් සිදුවුවහොත් අලාභය රක්ෂණයෙන් අයකර පියවා ගැනීමට කටයුතු කළ ද මුදල් රෙගුලාසි 156( 1) අනුව අනතුර සම්බන්ධ වගකිවයුතු අයෙක් සිටීනම් අලාභය ඔහුගෙන් අයකර ගත යුතු බවත්, මෙහිදි කැබ් රථයට අනතුර සිදුකල ලොරි රථයේ රියදුරුට විරුද්ධව නිතීමය පියවර නොගෙන ප්‍රාදේශීය ලේකම් විසින් සමථයකට පත්කර ගැනීම නිසා රජයට වූ හානිය අයකර ගැනීමේ අවස්ථාව මගහැරි ගොස් ඇති බැවින් ප්‍රාදේශීය ලේකම්ගෙන් හා රියදුරුගෙන් අලාභය අයකර ගැනීමට තීරණය කර ඇති බවත් දක්වා ඇත.

**නිරික්ෂණ :-**

මුදල් රෙගුලාසි 103(i) (ආ) යටතේ අනතුරක් සිදුවූ විට ක්‍රියාකළ යුතු පිළිවෙල පැමිණිලිකාරිය විසින් අනුගමනය කර ඇති අතර, ඒ අනුව එම අවස්ථාවේදීම පොලිස් ස්ථානයට හා රක්ෂණය සමාගමට නිසි ලෙස දැනුම් දීම් සිදුකර ඇති බව නිරික්ෂණය වේ.

මුදල් රෙගුලාසි 156(i) යටතේ 'යම්කිසි නිලධාරියෙකුගේ ප්‍රමාදයක්, නොසැලකිල්ලක් වරදක් හෝ වංචාවක් හේතුකොට ගෙන රජයට ඕනෑම පාඩුවක් සම්බන්ධයෙන් ඒ නිලධාරියා පෞද්ගලිකව වගකිවයුතු බව' සඳහන්

වන අතර, පැමිණිලිකාරියගේ පැමිණිල්ල අනුව අනතුර සිදුවූ අවස්ථාවේ පැමිණිලිකාරිය රාජකාරි කටයුතුවල යෙදෙමින් සිටි බව නිරීක්ෂණය වේ. ඒ අනුව 156(1) වගන්තියේ කියවෙන කරුණු පැමිණිලිකාරිය සම්බන්ධයෙන් අදාළ නොවන බවද නිරීක්ෂණය වේ.

156(1)(iii) යටතේ "ප්‍රමාණවත් සැළකිල්ලක් නොදක්වමින්" යන්න ගත්විට පැමිණිලිකාරිය විසින් මෙම අවස්ථාවේදී ප්‍රමාණවත් සැළකිල්ලක් නොදැක්වූවායැයි නිගමනය කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත්කර නොමැති අතර, සිද්ධිය සිදුවූ වහාම පොලිස් ස්ථානයට මෙන්ම රක්ෂණ සමාගමට අනතුර පිළිබඳව දන්වා සිටිමින් පැමිණිලිකාරිය ආසන්නතම රාජකාරිය ඉටුකර ඇති බවද නිරීක්ෂණය වේ.

මුදල් රෙගුලාසි 105(5) යටතේ දක්වා ඇත්තේ, 'අනාහාකාරයකින් අයකර ගනු ලබන අලාභ ඇතැම් අවස්ථාවන්හිදි අලාභය ආදායකයාගෙන් හෝ බැංකුවකින් හෝ වෙනත් නිසි පාර්ශවයකින් හෝ අයකර ගත හැකි නම් හෝ ක්‍රියාත්මක කළ හැකි රක්ෂණ ඔප්පුවකින් හෝ ආවරණය වේ නම් ඒ හානිය සම්බන්ධයෙන් අයකර ගත යුතු උපරිම මුදල ගෙවන ලෙස ඒ හානිය ගැන වගකීම් පැවරී ඇති නිලධාරින්ට නියම නොකර සිටිය හැකිය. වගකීම පැවරී ඇති නිලධාරීන්ට විරුද්ධව විනායානුකුල ක්‍රියා නොකළ යුතු බවත්' මෙයින් අදහස් නොකෙරෙන බවයි.

ඒ අනුව, රක්ෂණ සමාගම විසින් මෙම අලාභ මුදල පියවා ඇති බවත්, පැමිණිලිකාරිය ඒ සඳහා වගකිව යුතු නැති බවත් නිරීක්ෂණය වේ.

තවද, යම් රජයේ නිලධාරියෙකුගේ වැටුපෙන් අදාළ අලාභයක් අයකර ගැනීමට නම් ඒ සඳහා එම නිලධාරියා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා එම පරීක්ෂණයේ විනය නියමයන්ට අනුව අදාළ අලාභය අයකර ගත යුතුය. නමුත් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් නොපවත්වා පැමිණිලිකාරියගේ අලාභයක් අය කර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර වෙතින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් කර ඇත්තේ රජයට අය විය යුතු මුදල රක්ෂණ සමාගම විසින් ලබාදී ඇති බවත්, එමඟින් රජයට තවදුරටත් අලාභයක් සිදුනොවන බවත්, මේ සම්බන්ධයෙන් පැමිණිලිකාරිය එරෙහිව විනයානුකූලව ක්‍රියා මාර්ගයක් ගැනීමට අවශ්‍ය නොවන බවත්ය.

ඉදිරිපත්ව ඇති සියළු කරුණු සලකා බැලීමේදී අදාළ අනතුර සම්බන්ධයෙන් විධිමත් විනයානුකූල පරීක්ෂණයක් සිදුනොකර පැමිණිලිකාරියගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අයකර ගෙන ඇති බවටත්,අනතුර සම්බන්ධයෙන් වන අලාභය අදාළ රක්ෂණ සමාගම විසින් ගෙවා ඇති බවටත්, කරුණු ඉදිරිපත්ව වන බැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ12(1) හි සඳහන් 'නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය' යන මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ12(1) හි සඳහන් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, මෙම පැමිණිලිකාරියගෙන් වාරික වශයෙන් අයකරගෙන ඇති රු. 55383.00 ක මුදල නැවත පැමිණිලිකාරිය වෙත ගෙවීමට පියවර ගත යුතුය.

2022. 12 . 22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම්‍යා.ගේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.G. N[illegible]
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
ස්වදේශ කටයුතු හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුරය.

B/